පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
Department of Education – North Central Province

| ශ්‍රේණිය 11 | 2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01<br>විෂය :- ඉතිහාසය I | කාලය : පැය 01 යි |
|---|---|---|

ශිෂ්‍යයාගේ නම /ඇතුළත්වීමේ අංකය :- ..........................................
පාසලේ නම :- ..........................................

**උපදෙස් :-**

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් **නිවැරදි හෝ ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

1. දික්සද සෙනෙවි පිරිවෙන්පති රචිත වංශ කතාව කුමක් ද?
(1) දීපවංශය (2) ධාතුවංශය (3) බෝධිවංශය (4) මහාවංශය

2. දීපවංශය රචනා කිරීමට උපකාරි නොවූ සාහිත්‍ය මූලාශ්‍රය වූයේ කුමක්ද?
(1) විනයට්ඨ කතා (2) උත්තර විහාරට්ඨ කතා (3) සීලහට්ඨ කතා වංශය (4) වංසත්ථප්පකාසිනිය

3. නාණක විද්‍යාව තුළින් හදාරනු ලබන්නේ මින් කුමන ක්ෂේත්‍රයක් පිළිබඳව ද?
(1) කාසි (2) නටඹුන් (3) වාස්තු විද්‍යාව (4) අභිලේඛන

4. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූවා යැයි සැලකෙන "බූන්දල" අයත් වන්නේ කුමන දේශගුණික කලාපයකට ද?
(1) පහතරට වියළි කලාපයට (2) අර්ධ ශුෂ්ක කලාපයට
(3) කඳුරට වියළි අතරමැදි කලාපයට (4) තෙත් කලාපය

5. පූර්ව ඓතිහාසික යුගය සංක්‍රාන්ති අවධියක් ලෙස සැලකීමේ දී ඊට අදාළ නොවන කරුණ වන්නේ මින් කුමක් ද?
(1) පිළිස්සූ මැටි බඳුන් භාවිතය (2) ලෝහ භාවිතය
(3) සංචාරක ජන ජීවිතය (4) ක්‍රමවත් අභිචාර විධි අනුගමය කිරීම

6. මුල් ඓතිහාසික ජනතාව ගංගා නිම්නවලින් පිටත ප්‍රදේශවල සිය ජනාවාස ඉදිකිරීම සඳහා බලපෑ ප්‍රධානතම හේතුව වූයේ,
(1) සාරවත් භූමියක් නොමැති වීමයි (2) වන සතුන්ගෙන් ආරක්ෂා වීමට
(3) ගංවතුර උවදුරින් බේරීම සඳහායි (4) ගමනා ගමනය පහසුව තිබීම

7. මධ්‍යගත පාලනය සාර්ථක කර ගැනීමේ දී දුටුගැමුණු රජුට සහය ලබා නොදුන් සෙන්පතියෙකු වූයේ කවුරුන් ද?
(1) වේළුසුමන (2) ඵුස්සදේව (3) ගෝඨයිම්බර (4) නන්දිමිත්‍ර

8. ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම සඳහා "ආස්ථාන" වෙන්කොට ඇමතිවරුන් පත්කළ රජතුමා වූයේ,
(1) වසභ රජු ය (2) දුටුගැමුණු රජු ය
(3) පණ්ඩුකාභය රජු ය (4) දේවානම්පියතිසස රජු ය

9. රාජත්ව සංකල්පය යටතේ කාලිංග චක්‍රවර්තී යන නමින් හැඳින්වූ රජතුමා කවුද?
(1) කාලිංග මාඝ ය (2) නිශ්ශංකමල්ල රජු ය (3) පළමුවන කාශ්‍යප රජු ය (4) මහසෙන් රජු ය



CamScanner

Past Papers Wiki

10. පළමුවැනි විජයබාහු රජතුමා පොළොන්නරුව සිය පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීමට බලපෑ ප්‍රධානතම සාධකයක් වූයේ,
(1) ගෝකණ්ණතිත්ථ වරාය ඉන්දියන් සාගරයේ නැගෙනහිරට මුහුණ ලා තිබීම නිසා වෙළෙඳ කටයුතු පාලනය පහසු වීම නිසා යි.
(2) චෝල ආක්‍රමණ පහසුවෙන් පරාජය කිරීමට හැකිවීම නිසා යි.
(3) ඉන්දියාව සමඟ වෙළෙඳ සබඳතා සාර්ථකව සිදුකිරීමට අවස්ථාව හිමිවීම නිසා යි.
(4) අපරදිග රටවල් සමඟ පහසුවෙන් වාණිජ කටයුතු කිරීමට හැකිවීම නිසා යි.

11. මහා විහාරයේ වැඩ වාසය කරමින් ත්‍රිපිටක ධර්මයට අටුවා රචනා කළ හිමි නම වූයේ,
(1) පාහියන් හිමි (2) හියුං සියැං හිමි (3) බුද්ධඝෝෂ හිමි (4) මහානාම හිමි

12. ඇළහැර ඇළ මඟින් ජලය සැපයෙන වැවක් නොවන්නේ,
(1) මින්නේරි වැව යි (2) ගිරිතලේ වැව යි (3) කවුඩුල්ල වැව යි (4) සොරබොර වැව යි

13. වැව් එල්ලංගාව හෙවත් වැව් ප්‍රපතනය යන වැව් පද්ධති නිර්මාණය කිරීමේ මූලිකම අරමුණක් වූයේ,
(1) පාංශු ඛාදනය වැළැක්වීම යි (2) දේශගුණයේ සමබර බව රැක ගැනීම යි
(3) ජල සංරක්ෂණය සඳහා යි (4) ගංවතුර පාලනය සඳහා යි

14. නිසි කල සී සෑම නොකරන පුද්ගලයන්ට කලං පහක දඩයක් නියම කළ පුවතක් සඳහන් සෙල්ලිපිය කුමක් ද?
(1) කොණ්ඩවට්ටවාන් ලිපිය (2) වෙවැල්කැටිය ලිපිය (3) මිහින්තලා පුවරු ලිපිය (4) බුදුලු වැව් ලිපිය

15. පහත A,B,C හා D යටතේ සඳහන් වන ඓතිහාසික සිදුවීම් ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව පෙළගැස් වූ විට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?
A. ජෝතිය සිටුවරයා ඇති කළ කැරැල්ල මැඩ පැවැත්වීම.
B. කව්සිළුමිණ නම් කාව්‍ය ග්‍රන්ථය රචනා වීම.
C. ආර්ය චක්‍රවර්ති දළදාව පැහැරගෙන පාණ්ඩ්‍ය රජුට ලබා දීම.
D. ගඩලාදෙණි විහාරය ඉදි කිරීම.
(1) B D C A (2) B C D A (3) B C A D (4) B A D C

16. ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපයක් **I තීරුවේ** ද, පැරණි පරිපාලන බෙදීම් කිහිපයක් **II තීරුවේ** ද දක්වේ. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. අනුරාධපුර | A. මායා රට |
| 2. ගම්පොළ | B. රුහුණු රට |
| 3. දඹදෙණිය | C. මලය රට |
| | D. රජරට |

(1) A C හා B (2) D C හා A (3) B A හා C (4) D B හා A

17. මහනුවර රාජධානිය කෝට්ටේ ග්‍රහණයෙන් මුදවා ගනිමින් ප්‍රථම වරට ස්වාධීන රාජ්‍යයක් ලෙස ගොඩනගන ලද රජතුමා,
(1) පළමුවැනි විමලධර්මසූරිය රජු ය (2) සෙනරත් රජු ය
(3) සේනාසම්මත වික්‍රමබාහු රජු ය (4) පළමුවැනි රාජසිංහ රජු ය

☒ පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 18 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.
A. මුල්ලේරියා සටනින් පෘතුගීසි පරාජයට පත්වීම.
B. දෙවැනි රාජසිංහ රජතුමා ලන්දේසීන් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම.

18. උඩරට රාජධානිය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A හා B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.



CamScanner

19. චීනයේ සිට පැමිණි චෙන් හෝ සෙන්පතියා මෙරට ට ආක්‍රමණ එල්ල කළේ කුමන රාජධානි සමයක ද?
(1) දඹදෙණි (2) කෝට්ටේ (3) යාපහුව (4) ගම්පොළ

20. පෘතුගීසීන් ශ්‍රී ලංකාව හැඳින්වීම සඳහා භාවිත කළ නාමය වූයේ,
(1) තැප්‍රොබේන් (2) සිලෝන් (3) සෙයිලන් (4) සෙරන්ඩිබ්

21. මධ්‍යතන යුගයේ දී ආසියාවේ වෙළෙඳ ආධිපත්‍ය හිමි කරගෙන සිටියේ,
(1) මුස්ලිම්වරු ය (2) පෘතුගීසීන් ය (3) ලන්දේසීන් ය (4) ඉන්දියානුවන් ය

22. ශාස්ත්‍රීය පුනරුදය ආරම්භ වූයේ,
(1) ඉතාලියෙනි (2) තුර්කියෙනි (3) බ්‍රිතාන්‍යයෙනි (4) පෘතුගාලයෙනි

23. අවසාන රාත්‍රී භෝජන සංග්‍රහය නම් චිත්‍ර නිර්මාණය කාගේ ද?
(1) මයිකල් ඇංජිලෝගේ ය (2) ලියනාඩෝ ඩාවින්චිගේ ය (3) රෆායල්ගේ ය (4) බොට්ටි චෙලිගේ ය

24. අත්හදා බැලීමේ පියා ලෙස හැඳින්වූයේ,
(1) ගැලීලියෝ ගැලිලි ය (2) නිකලස් කොපර්නිකස් ය (3) ජොහැන්නස් කෙප්ලර් ය (4) අයිසැක් නිව්ටන් ය

25. 19 වන සියවස වන විට ලොව වැඩිම යටත් විජිත හිමිකරගත් රාජ්‍ය වූයේ,
(1) පෘතුගාලය යි (2) ස්පාඤ්ඤය යි (3) ප්‍රංශය යි (4) බ්‍රිතාන්‍ය යි

26. ක්‍රි.ව. 1815 දී උඩරට යටත් කර ගැනීම සඳහා විවිධ උපක්‍රම මගින් තොරතුරු ලබාගත් පුද්ගලයා වූයේ,
(1) ජෝන් ඩොයිලි ය (2) රොබට් බ්‍රවුන්රිග් ය (3) මැක්ඩෝවල් ය (4) රොබට් ඇන්ඩෘස් ය

27. ඉංග්‍රීසීන්ට උඩරට රාජධානිය පහසුවෙන් යටත් කර ගැනීමට තුඩු දුන් වැදගත්ම සාධකය වූයේ,
(1) ඉංග්‍රීසීන්ගේ යුධ ශක්තිය යි (2) උඩරට ජනතාව ඉංග්‍රීසීන්ට පක්ෂපාතී වීම යි
(3) උඩරට රජු හා ජනතාව අතර සබඳතා දුරස් වීම යි (4) උඩරටියන්ගේ ගරිල්ලා සටන් ක්‍රමය යි

28. 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දක්වේ. ඒවායින් නොගැළපෙන යුගලය කුමක් ද?
(1) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම - සිද්දි ලෙබ්බේ මහතා
(2) පංච මහා වාද පැවැත්වීම - හික්කඩුවේ සුමංගල හිමි
(3) උදයභානු පුවත්පත ආරම්භ කිරීම - ආරුමුග නාවලර්තුමා
(4) පරමවිඥානාර්ථ සමාගම පිහිටුවීම - හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා.

29. චර්ච් මිෂනාරි සංවිධානය විසින් නිකුත් කළ ප්‍රකාශනය මින් කුමක් ද?
(1) උරගල (2) මාසික තැග්ග (3) ලංකා නිධානය (4) ලක්මිණි පහන

30. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා වූයේ,
(1) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා ය (2) එෆ්.ආර්. සේනානායක මහතා ය
(3) පොන්නම්බලම් අරුනාචලම් මහතා ය (4) පොන්නම්බලම් රාමනාදන් මහතා ය

31. ඩොනමෝර් ප්‍රතිසංස්කරණය මගින් හඳුන්වා දුන් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලාංකික අමාත්‍යවරයෙකුට හිමි නොවූ විෂය ක්ෂේත්‍රය වන්නේ,
(1) මුදල් කටයුතු (2) අධ්‍යාපනය (3) පළාත් පාලනය (4) සෞඛ්‍ය

PAST PAPERS WIKI

☒ පහත A සිට F දක්වා ඇති තොරතුරු ඇසුරෙන් 32 සිට 34 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
B. ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව ස්ථාපිත කිරීම.
C. උගත් ලාංකිකයෙකුට නියෝජන අවස්ථාව ලබා දීම.
D. සීමිත ඡන්ද බලය හඳුන්වා දීම.
E. අග්‍රාණ්ඩුකාරධුරය ඇති කිරීම.
F. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම.

32. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දුන් අංග වූයේ,
(1) A හා F (2) B හා E (3) B හා F (4) C හා D



CamScanner

33. කෘෘචි මැකලම් ප්‍රතිසංස්කරණ මඟින් හඳුන්වා දුන් අංග,

(1) A හා F (2) B හා E (3) B හා F (4) C හා D

34. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන අංග වූයේ,

(1) A හා F (2) B හා E (3) B හා F (4) C හා D

35. ශ්‍රී ලංකාව ප්‍රථම වරට ඒකීය ජනරජයක් බවට පත්වූයේ කුමන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?

(1) ඩොනමෝර් (2) 1972 (3) 1978 (4) සෝල්බරි

36. ජාතික වැදගත්කමකින් යුතු කරුණු සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබා ගන්නා ඡන්ද ක්‍රමය වූයේ,

(1) ජනාධිපතිවරණය (2) මහ මැතිවරණය (3) පළාත් සභා මැතිවරණය (4) ජනමත විචාරණය

37. සූවස් ඇළ ජනසතු කළ ඊජිප්තු ජනපතිවරයා කවුරුන් ද?

(1) අබ්දුල් ගමාල් නසාර් (2) මාෂල් ටිටෝ

(3) වින්ස්ටන් චර්චිල් (4) ඇඩොල්ෆ් හිට්ලර්

☒ පහත A B C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර 38 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**A** – 1. රාජාණ්ඩු ක්‍රමය
2. ප්‍රංශ විල්පවය

**B** – 1. ඇමරිකානු විප්ලවය
2. බොස්ටන් තේ සාදය

**C** – 1. රුසියන් විප්ලවය
2. සමාජවාදී දර්ශනය

**D** – 1. ස්ටේට්ස් ජෙනරල් සභාව
2. රුසියානු විප්ලවය

38. පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස දෙවැන්න ව්‍යාප්ත වූ බව දක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. දෙවැන්නේ ජයග්‍රහණයත් සමඟ පළමුවැන්න බිඳ වැටුණු බව දක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න හා දෙවැන්න අතර සබඳතාවක් නොදක්වෙන ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

CamScanner

(සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved)

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்

## Department of Education – North Central Province

| ශ්‍රේණිය 11 | 2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01 | කාලය පැය 03 යි මි.10 |
|---|---|---|
| | විෂය :- ඉතිහාසය (II) | |

සිසුයාගේ නම /ඇතුළත්වීමේ අංකය :- ..............................

පාසලේ නම :- ..............................

උපදෙස් :-

- **I කොටසේ** ප්‍රශ්න අංක 1 **අනිවාර්ය** වේ.
- **II කොටසින්** ප්‍රශ්න **හතරකට** ද, **III කොටසින්** ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

### I කොටස

1. (අ)

i. පහත දක්වා ඇති ඓතිහාසික **ස්ථාන සියල්ලම** සපයා ඇති ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
කතරගරායත් ආරු, මහියංගණය, කුරුණෑගල, මින්නේරි වැව, දීඝවාපි, ප්‍රණුගම්වෙහෙර ජලාශය, මීගමුව, අලිමංකඩ, කළු ගඟ, දෙවිනුවර, හෝර්ටන්තැන්න, ගන්නෝරුව (ලකුණු 12)

ii. පහත දක්වා ඇති ඓතිහාසික **ස්ථාන සියල්ලම** සපයා ඇති ලෝක සිතියමේ කොටසෙහි ලකුණු කර නම් කරන්න.
නාගසාකි, මුම්බායි, ස්පාඤ්ඤය, තායිවානය, ජාවා දූපත, අරාබි මුහුද (ලකුණු 06)

(ආ)

i. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A. දකුණු ඉන්දිය කුලී හමුදාවන්ගෙන් සහය ලබාගත් මෙරට ප්‍රථම රජතුමා කවුරුන් ද?

B. ප්‍රථම වරට මහ වැව් ඉදිකිරීම ආරම්භ කළ රජතුමා කවුරුන් ද?

C. කාර්මික විප්ලවය ආරම්භ වූයේ එංගලන්තයේ කුමන නගරය කේන්ද්‍ර කර ගනිමින් ද?

D. ජර්මන් අධිරාජ්‍යයක් බිහි කිරීමේ අරමුණින් කටයුතු කළ පාලකයා කවුරුන් ද? (ලකුණු 04)

ii. A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

**(A)**



1. මෙම පින්තූරයේ සිටින රජු කවුරුන් ද?
2. මොහු පාලන කටයුතු සිදු කළේ කුමන රාජධානි සමයක ද?
3. රාජත්වයට පත්වීමට පෙර මොහු හැඳින්වූයේ කුමන නමකින් ද?
4. මොහු 1638 දී ගිවිසුමක් ඇතිකර ගත්තේ කුමන බටහිර ජාතින් සමඟ ද?

(ලකුණු 04)

(B)



1. මෙම චිත්‍රයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම කුමක් ද?
2. මෙම සිදුවීමත් සමඟ ආරම්භ වූ විප්ලවය කුමක් ද?
3. මෙම සිදුවීමෙන් පසු බ්‍රිතාන්‍යයන් විසින් වසා දැමූ වරාය කුමක්ද?
4. මෙම සිදුවීමෙන් පසු ජනපදවාසීන් ප්‍රථම මහද්වීපික සම්මේලනය පැවැත්වූයේ කුමන නගරයක ද?

(ලකුණු 04)

## II කොටස

**2.**

i. පහත A, B හා C යටතේ දක්වා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A. මහාවංශය රචිත මහානාම හිමි වැඩ වාසය කළ විහාරය.

B. "ලංකා පුරාවෘත්තය" නමින් ග්‍රන්ථයක් රචනා කළ ඕලන්ද ජාතික කතුවරයා.

C. ගල්පොත සෙල්ලිපිය කෙටුම්පත් කළ රජ දවස. (ලකුණු 03)

ii. සෙල්ලිපි ලියා ඇති පාෂාණයේ ස්වරූපය අනුව වර්ගීකරණය කෙරෙන කොටස් **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

iii. ඉතිහාසය ඉගෙනීමේ දී පුරාවිද්‍යා මූලාශ්‍රයක් ලෙස කාසිවල වැදගත්කම **කරුණු දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. ඉතිහාසය ගවේෂණය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍ර වලින් ලැබෙන ප්‍රයෝජන **කරුණු තුනක්** මගින් විස්තර කරන්න. (ලකුණු 06)

**3.**

i. පූර්ව රාජ්‍ය සමය තුළ පාලන කටයුතු මෙහෙයවූ තනතුරු නාම **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට **නිවැරදි පිළිතුරු වරහන් තුළින් තෝරා** ලියන්න.

A. ප්‍රාදේශීය පාලනයට සම්බන්ධ කාන්තාවන් හැඳින්වූ නාමය.

B. රාජ කකුධ භාණ්ඩ සමඟ නැවත අභිෂේක ලද රජතුමා.

C. "පර්වතරාජ" යන විරුදය නාමය භාවිතා කළ රජතුමා.

D. නගර පාලනය කළ තැනැත්තන් සෙල්ලිපි වල හැඳින්වූ නාමය.

**(දේවානම්පියතිස්ස රජු, නගර වුඩික, නිශ්ශංකමල්ල රජු, නගර ගුතික, පරුමකලු, කොටබොජක, I කාශ්‍යප රජු)** (ලකුණු 04)

iii. රටක පාලකයෙකුගෙන් තම රටවැසියාට ඉටුවිය යුතු යුතුකම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. මධ්‍යගත පාලනයක් ගොඩනගාගත් ප්‍රථම පාලකයා ලෙස පණ්ඩුකාභය රජුගේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**4.**

i. අතීතයේ දී අවකාශය මැනීම සඳහා යොදාගත් මිනුම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C හා D යටතේ ඇති කාර්යන් හා බැඳෙන වැවක අංග **නිවැරදි අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A. වැවේ වැඩි ජලය පිටතට මුදා හැරීම.

B. වැව් බැම්ම සේදී යාම වැළැක්වීම.

C. වැවට එකතුවන ජලය රඳවා ගැනීම.

D. වැවේ රොන්මඩ ඉවත් කිරීම. (ලකුණු 04)

iii. සනීපාරක්ෂාව හා ස්වස්ථතාව අතීතයෙන් උරුම වූ සුවිශේෂී දායාදයක් බව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. පුරාණ යකඩ නිස්සාරණය මෙරට තාක්ෂණයේ සුවිශේෂී අවස්ථාවක් බව කරුණු **තුනක්** මගින් සනාථ කරන්න. (ලකුණු 06)

**5.**

i. මහනුවර රාජධානි සමයේ බද්දේ සංවිධානයට අයත් වූ බදු වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. පහත A, B, C හා D යන කාර්යන් හා බැඳෙන පුද්ගලයින් **නිවැරදි අනුපිළිවෙලින්** නම් කරන්න.

A. ගන්නෝරුව සටනින් පෘතුගීසීන් පරාජයට පත් කිරීම.

B. වැලිවිට සරණංකර හිමිට සංඝරාජ තනතුර පිරිනැමීම.

C. දළදා වහන්සේ භාරව කටයුතු කිරීම.

D. නායක්කර් වංශයේ ප්‍රථම රජු ලෙස මෙරට රජවීම. (ලකුණු 04)

iii. පළමුවැනි විමලධර්මසූරිය රජු තම රාජත්වය නීත්‍යානුකූල කර ගැනීමට ගත් ක්‍රියාමාර්ග **දෙකක්** පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. මහනුවර රාජධානියේ ආර්ථික රටාව සකස් වී තිබූ ආකාරය කරුණු **තුනක්** මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

**6.**

i. පහත A, B, හා C යටතේ දැක්වෙන ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු **අනුපිළිවෙලින්** ලියා දක්වන්න.

A. ලූල්කඳුර වතුයායේ ආදර්ශ තේ වත්තක් ආරම්භ කළ ඉංග්‍රීසි නිලධාරියා.

B. කෝපි වගාවේ උන්නතිය වෙනුවෙන් කෝපි වලින් අය කළ අපනයන බද්ද අඩු කළ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා.

C. ලංකා කම්කරු සංගමය පිහිටුවීමට මූලිකත්වය ගත් පුද්ගලයා. (ලකුණු 03)

ii. 19 වන සියවස අගභාගය වන විට මෙරට කෝපි වගාවේ පරිහානියට තුඩුදුන් හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

iii. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මෙරට වතු වගාවේ උන්නතියට වැදගත් වූ ආකාරය කරුණු **දෙකක්** මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. දහනව වැනි සියවසේ ආරම්භ වූ වතුවගාව මෙරට ආර්ථික හා සමාජීය පරිවර්තනයකට හේතු වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 06)

**7.**

i. පහත A B හා C යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු **අනුපිළිවෙලින්** ලියා දක්වන්න.

A. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ එංගලන්ත කිරීටයේ මෙරට නියෝජනය සඳහා ඇති කළ තනතුර.

B. එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමට මූලිකත්වය ගත් පුද්ගලයා.

C. මෙරට ප්‍රථම නාමික විධායක ජනාධිපති. (ලකුණු 03)

ii. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

iii. 1978 ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් විධායක ජනපති සතු ව්‍යවස්ථාදායක හා විධායක බලතල **දෙකක් උදාහරණ මඟින්** පැහැදිළි කරන්න. (ලකුණු 05)

iv. 1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඡන්ද විමසීමේ ක්‍රම **තුන** පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06)

CamScanner

## III කොටස

[illegible] සිදු කළ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

[illegible] නිවැරදි පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

- [illegible]
- [illegible] කළ ජර්මන් ජාතිකයා.
- [illegible] කිරීම.
- [illegible] දේශගවේෂකයා. (ලකුණු 04)

[illegible] හා සාහිත්‍යයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

[illegible] වැදගත්ම අංගයක් වූ චිත්‍ර කලාවේ ඇති වූ නවෝදය කරුණු **[illegible]** [illegible] පැහැදිලි කරන්න. (ලකුණු 06)

ඇමරිකාවේ ජනපද පිහිටි වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ඇමරිකානු නිදහස් සටනට තුඩු දුන් හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

ප්‍රංශ රජවරුන්ගේ ඒකාධිපති පාලන රටාව ප්‍රංශ විප්ලවයට හේතු වූ ආකාරය කරුණු **දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

**8.** (ලකුණු 03)

i. පුනරුද සමයේ විශ්වය පිළිබඳ නව මතවාද ඉදිරිපත් කළ පුද්ගලයින් **තිදෙනෙකු** නම් කරන්න.

ii. පහත **A B C** හා **D** යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A. පුනරුදය ආරම්භ වූ ඉතාලි නගරය.

B. පල්ලියේ ආධිපත්‍ය විවේචනය කළ ජර්මන් ජාතිකයා.

C. මෝසෙස්ගේ ප්‍රතිමාව නිර්මාණය කිරීම. (ලකුණු 04)

D. බටහිර ඉන්දීය දූපත් සොයාගත් දේශගවේෂකයා.

iii. පුනරුදයේ ආරම්භයත් සමඟ භාෂාව හා සාහිත්‍යයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. ඉතාලියෙන් ආරම්භ වූ පුනරුදයේ වැදගත්ම අංශයක් වූ චිත්‍ර කලාවේ ඇති වූ නවෝදය කරුණු **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**9.**

i. ඇමරිකාවේ ජනපද පිහිට වූ යුරෝපා ජාතීන් **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

ii. ඇමරිකානු නිදහස් සටනට තුඩු දුන් හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

iii. ප්‍රංශ රජවරුන්ගේ ඒකාධිපති පාලන රටාව ප්‍රංශ විප්ලවයට හේතු වූ ආකාරය කරුණු **දෙකක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iv. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත**

**மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்**

**Department of Education – North Central Province**

| ශ්‍රේණිය 11 | 2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01<br>විෂය :- ඉතිහාසය I | කාලය : |
|---|---|---|

ශිෂ්‍යයාගේ නම /ඇතුළත්වීමේ අංකය :- ........................................

පාසලේ නම :- ........................................

**පිළිතුරු**

**I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 1 | 31. | 1 |
| 02. | 4 | 12. | 4 | 22. | 1 | 32. | 1 |
| 03. | 1 | 13. | 4 | 23. | 2 | 33. | 4 |
| 04. | 2 | 14. | 1 | 24. | 1 | 34. | 2 |
| 05. | 3 | 15. | 3 | 25. | 4 | 35. | 2 |
| 06. | 3 | 16. | 2 | 26. | 1 | 36. | 4 |
| 07. | 3 | 17. | 3 | 27. | 3 | 37. | 1 |
| 08. | 2 | 18. | 4 | 28. | 2 | 38. | 3 |
| 09. | 2 | 19. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 3 | 30. | 3 | 40. | 4 |

**(නිවැරදි එක් පිළිතුරකට 1 ලකුණ බැගින් ලකුණු 40 කි.)**

{සියලු ම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved }

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
## மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
## Department of Education – North Central Province

| ශ්‍රේණිය 11 | 2026 - අ.පො.ස.(සා/පෙළ) පෙරහුරු පරීක්ෂණය - 01 | කාලය : |
|---|---|---|
| | විෂය :- ඉතිහාසය II | |

ශිෂ්‍යයාගේ නම /ඇතුළත්වීමේ අංකය :- ..........................................

පාසලේ නම :- ..........................................

**පිළිතුරු**

**II** පත්‍රය

**01.** (අ)

**i.**



ii.



(ආ)

**i.** i. ඉලනාග රජතුමා

ii. වසභ රජතුමා

iii. ලන්ඩන්

iv. II විලියම් (ලකුණු 04)

**ii.** **A.**

1. II රාජසිංහ
2. මහනුවර/ උඩරට/ කන්ද උඩරට
3. මහා අස්ථාන
4. ලන්දේසි (ලකුණු 04)

**B.**

1. කැප්පෙටිපොළ / මොනරවිල කැප්පෙටිපොළ
2. 1818 නිදහස් අරගලය / ඌව වෙල්ලස්ස සටන / ප්‍රථම බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් අරගලය
3. දොරේසාමි / විල්බාවේ දොරේසාමි
4. මරණ දඬුවම / හිස ගසා මරා දැමීම (ලකුණු 04)

## II කොටස

**02.**

**i.**

A. දික්සඳ සෙනවියා පිරිවෙන

B. පිලිප්පස් බැල්ඩියස්

C. නිශ්ශංකමල්ල රජු/ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල (ලකුණු 03)

**ii.** i. ලෙන් ලිපි

ii. ගිරි ලිපි

iii. ටැම් ලිපි

iv. පුවරු ලිපි

v. ආසන ලිපි (ලකුණු 04)

**iii.**

i. පැරණි ලංකාවේ ආර්ථික තත්වය

ii. දේශීය වෙළෙඳාම

iii. විදේශීය වෙළෙඳාම

iv. ලෝහ භාවිතය හා තාක්ෂණය

v. පැරණි ලංකාවේ ආගමික තත්වය

vi. දේශපාලන බල ව්‍යාප්තිය (ලකුණු 05)

**iv.** i. ඓතිහාසික තොරතුරු කාල අනුපිළිවෙළ සකස් කර ගැනීමට හැකිවීම.

ii. එක් එක් අවධිවල දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘත කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හැකිවීම.

iii. එක් මූලාශ්‍රයක් මඟින් ලැබෙන තොරතුරු තවත් මූලාශ්‍රයක් මඟින් සනාථ කර ගැනීමට හැකිවීම.

iv. රටක විදේශීය සබඳතා අධ්‍යයනය කිරීමට (විදේශීය සාහිත්‍ය මූලාශ මෙහිදී විශේෂයෙන් වැදගත් වේ)

v. අඛණ්ඩ ඉතිහාසයක තොරතුරු දැනගැනීමට හැකි වීම. (ලකුණු 06)

**03.**

**i.** ගෘහපති, ගමික, පරුමක (ලකුණු 03)

**ii.** A. පරුමකලු

B. දේවානම්පියතිස්ස රජතුමා

C. I කාශ්‍යප රජු

D. නගර ගුතික (ලකුණු 04)

**iii.** i. දේශපාලන ස්ථාවරත්වය රට තුළ ඇති කිරීම.

ii. ආර්ථික සංවර්ධනය සිදු කිරීම.

iii. ආගමික කටයුතු දියුණු කිරීම.

iv. සමාජ සුහසාධනය ඇති කිරීම. (ලකුණු 05)

**iv.** i. පුර සංකල්පය ක්‍රියාත්මක කරමින් අනුරාධ ග්‍රාමය අනුරාධපුරය බවට පත් කිරීම.

ii. මාමාවරුන් කීපදෙනෙක් ඝාතනය කර ප්‍රාදේශීය පාලන ප්‍රදේශ ඈදා ගැනීම.

iii. තම රාජත්වයෙන් දසවන වර්ෂය වන විට දිවයින පුරා ග්‍රාම සීමා නියම කිරීම.

iv. ගාමිණී වැව, අභය වැව, ජය වැව යන වැව් ඉදිකර ගොවිතැන් කටයුතු දියුණු කිරීම හා නාගරික ජනතාවගේ ජල අවශ්‍යතා සපුරාලීම.

v. ක්‍රමවත් මධ්‍යගත පාලනයකට අවශ්‍ය නිලධාරීන් පත්කර පාලන තන්ත්‍රය ක්‍රමවත් කිරීම.

උදා :- පුරෝහිත, නගරගුතික (ලකුණු 06)

**04.**

**i.** i. කිරිය

ii. අමුණ

iii. කරීසය

iv. පැල (ලකුණු 03)

**ii.** A. පිටවාන

B. රළපනාව

C. වැව් බැම්ම

D. මඩ සොරොව්ව (ලකුණු 04)

**iii.**

i. අපේ රටේ පාලකයින් වෛද්‍ය ක්ෂේත්‍රය ගැන මැනවින් හදාරා තිබීම හා රජරට රාජධානි සමයේ රෝහල් නටඹුන් හමුවීම.

ii. අනුරාධපුර යුගයේ නගර වල කැලි කසළ බැහැර කිරීමට සැඩොලන් පත්කර සිටීම.

iii. ආලාහන පිරිවෙනේ සිදුවූ කැණීම් වලින් හමුවුණු වෛද්‍ය උපකරණ තුළින් මෙරට දියුණු වෛද්‍ය සේවාවක් තිබුණු බවට සාධක ලැබේ.

iv. කැසිකිළි වැසිකිළි වැනි නටඹුන් තුළින් පැරැන්නන් තුළ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ මනා අබෝධයක් තිබූ බව පෙනී යාම.

v. අනුරාධපුර හා පොළොන්නරු නගර වල අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයට සකස් කළ කාණු පද්ධතීන් දක්නට ලැබීම.

vi. නාන පොකුණු වල අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා විශේෂ නළ සකස් කර තිබීම. (ලකුණු 05)

**iv.** පුරාණ ලංකාවේ ජීවත් වූ වැසියන් යකඩ නිස්සාරණය කළ බව සාධක ලැබීම.

i. ඌව පළාතට අයත් බෙරගලින් සොයාගෙන ඇති ක්‍රි.පූ. 24000 අයත් යබොර කැබැල්ලෙන් මෙරට වැසියන් යකඩ උණු කළ බවට සාධක ලැබීම.

ii. මෙරට වැසියන් යකඩ නිස්සාරණය කළ බවට බලංගොඩ සමනල වැව ප්‍රදේශයෙන් සොයාගනු ලැබූ උඳුන තුළින් ද සීගිරියට නුදුරු අලකොල වැව දෙහිගහඇල කන්ද නැමති ස්ථානයෙන් හමුවූ උඳුන් වලින් ද යකඩ නිස්සාරණය කළ තාක්ෂණය හෙළිදරුව් වීම.

iii. ස්වභාවික පරිසරයේ පවතින යකඩ බහුල ගල් වලින් යකඩ වෙන්කර ගැනීමට පැරැන්නන් සතු තාක්ෂණික දැනුම.

iv. උඳුන් දැල්වීමට ස්වභාවික සුළං බලය යොදා ගැනීම.

v. සමනල වැව ප්‍රදේශයේ යකඩ නිස්සාරණය කිරීමට භාවිත කර ඇත්තේ ලිමොනයිට් සහ හෙමටයිට් යන රසායනික විද්‍යාත්මක නම් වලින් හඳුන්වන ගල් වර්ග යි.

vi. මොවුන් යකඩ නිස්සාරණය කිරීම සඳහා යොදාගෙන තිබෙන්නේ යකඩ මරන් නැමති දැව වර්ගය බව සනාථ වී ඇත. (ලකුණු 06)

**05.**

**i.** මඩිගේ බද්ද, කුරුවේ බද්ද, බඩහැල බද්ද, රදා බද්ද, හැඳ බද්ද (ලකුණු 03)

**ii.** A. II රාජසිංහ රජු

B. කීර්ති ශ්‍රී රාජසිංහ රජු

C. දියවඩන නිලමේ

D. ශ්‍රී විජය රාජසිංහ රජු (ලකුණු 04)

**iii.** i. කුසුමාසන දේවිය විවාහ කර ගැනීම.

ii. කතෝලික ආගම අතහැර විමලධර්මසූරිය යන බෞද්ධ නමකින් පෙනීසිටීම.

iii. දළදා මැදුරක් ඉදිකර දළදා වහන්සේට ආරක්ෂාව සැපයීම.

v. බුදු දහම නැවත නගා සිටුවීමට කටයුතු කිරීම. (ලකුණු 05)

**iv.** i. කෘෂිකර්මාන්තය පදනම් කරගත් ස්වයංපෝෂිත ආර්ථික රටාවක් ගොඩනැගී තිබීම.

ii. හේන් වගාව ප්‍රධාන වූ අතර වී වගාව සුළු වශයෙන් සිදු කිරීම.

iii. ගෙවතු වගාව සිදු කිරීම.

iv. සත්ව පාලනය ආර්ථිකයේ අංගයක් වීම.

v. විවිධ කර්මාන්ත පැවතීම.

උදා :- වෙඩි ලුණු, විවීමේ කර්මාන්තය, යකඩ හා වානේ, ලාක්ෂා කර්මාන්තය. (ලකුණු 06)

**06.**

**i.** A. ජේම්ස් ටේලර්

B. එඩ්වඩ් බාන්ස්

C. A.E. ගුණසිංහ (ලකුණු 03)

**ii.** i. හැමීලියා වැස්ට්‍රාටික්ස් නම් දිලීර රෝගය ඇතිවීම.

ii. ජාත්‍යන්තර වෙළෙඳපොළේ තරඟකාරිත්වය හා මිල ගණන් පහත වැටීම.

iii. පසේ සාරවත් බව අඩු වීම හා පස සෝදා යාම.

iv. කෝපි අස්වැන්න අඩුවීම නිසා ආයෝජනයන් අඩුවීම. (ලකුණු 04)

**iii.** i. නව ඉඩම් නීති ගෙනඑමින් වතු වගාවට අවශ්‍ය ඉඩම් පහසුවෙන් ලබා ගැනීම.

ii. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අවලංගු කිරීම.

iii. ඉතිරි කිරීමේ බැංකුවක් ආරම්භ කිරීම.

iv. දකුණු ඉන්දීය ශ්‍රමය අඩු වැටුපකට ලබා ගැනීම.

v. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම. (ලකුණු 05)

**iv.** **ආර්ථික වෙනස්කම්**

i. ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ වැටීම.

ii. වාණිජවාදී ආර්ථිකයකට මාරු වීම.

iii. යටිතල පහසුකම් දියුණු වීම.

iv. මූල්‍ය හා බැංකු පද්ධති ආරම්භ වීම.

v. දේශීය ව්‍යවසායක පන්තියක් බිහිවීම.

vi. වැවිලි ආර්ථිකය ප්‍රධානතම ආදායම් මාර්ගය බවට පත්වීම.

**සමාජීය වෙනස්කම්**

i. නව සමාජ පන්තියක් බිහිවීම. උදා :- ධනපති හා නිර්ධන පන්තිය

ii. ගැමි ජනතාවට ඉඩම් අහිමි වීම.

iii. ඉංග්‍රීසි අධ්‍යාපනය දියුණු වීම.

iv. නාගරීකරණයක් ඇති වීම.

v. කම්කරු පන්තියක් බිහිවීම.

vi. ඉන්දියානු දෙමළ කම්කරුවන් නිසා ජන සංයුතියේ වෙසක් ඇති වීම. (ලකුණු 06)

**07.**

**i.** A. අග්‍රාණ්ඩුකාරධූරය

B. ඩී.එස්. සේනානායක

C. විලියම් ගොපල්ලව (ලකුණු 03)

**ii.** i. ලංකාව නමින් හැඳින්වූ රට ශ්‍රී ලංකාව නමින් හැඳින්වීම.

ii. ශ්‍රී ලංකාව ඒකීය ජන රජයක් බවට පිළිගැනීම.

iii. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග තිබූ ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම.

iv. ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කරයි.

v. නාමික විධායක ජනාධිපතිධූරය.

vi. ජාතික රාජ්‍ය සභාව.

vii. අධිකරණ පද්ධතිය. (ලකුණු 04)

**iii.** i. ව්‍යවස්ථාදායක බලතල

- පාර්ලිමේන්තුව කැඳවීම.
- වාරාවසාන කිරීම.
- මහ මැතිවරණයකින් පසුව පැවැත්වෙන මංගල පාර්ලිමේන්තු රැස්වීමේ මුලසුන දැරීම.
- ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම හා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම.

ii. විධායක බලතල

- අගමැතිවරයා පත් කිරීම.
- ඇමතිවරුන් පත් කිරීම.
- ඇමතිවරුන්ට විෂය හා කාර්ය පැවරීම.

iii. අධිකරණ බලතල

- අග්‍රවිනිශ්චයකාරතුමා ඇතුළු ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් පත් කිරීම.
- අධිකරණයකින් වරදකරු කළ තැනැත්තෙකුට සමාව දීම.
- දඬුවම් ලිහිල් කිරීම.

vi. රාජ්‍ය නායකයා ලෙස බලතල

- යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම.
- රාජ්‍ය උත්සව වල මුලසුන දැරීම.
- ජාත්‍යන්තර වශයෙන් ජනරජය නියෝජනය කිරීම.
- රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීම. (ලකුණු 05)

**iv.**

i. ජනාධිපතිවරණය.

ii. සමානුපාතික නියෝජන ක්‍රමය.

iii. ජනමත විචාරණය. (ලකුණු 06)

## III කොටස

**08.**

**i.** නිකලස් කොපර්නිකස්, අයිසෙක් නිව්ටන්, ජොහැන්නස් කෙප්ලර්, ගැලීලියෝ ගැලීලි (ලකුණු 03)

**ii.** A. ෆ්ලෝරන්ස්

B. මාර්ටින් ලූතර්

C. මයිකල් ඇංජිලෝ

D. ක්‍රිස්ටෝපර් කොලොම්බස් (ලකුණු 04)

**iii.** i. මධ්‍යතන යුගයේ තිබූ ගෝත්‍රික/ ප්‍රාදේශීය භාෂාවන් භාවිතයෙන් තොරවීම.

ii. මධ්‍යතන යුගයේ යටපත්ව තිබූ ග්‍රීක හා ලතින් භාෂාවන්ට නැවත ජීවය ලැබීම.

iii. ග්‍රීක නාට්‍ය පිළිබඳව උනන්දුවක් ඇතිවීම.

iv. ගත් කතුවරුන් රැසක් බිහිවීම හා ඔවුන්ගේ සුප්‍රසිද්ධ නිර්මාණයන් බිහිවීම.

උදා :- ඩාන්ටේ - ඩිවීනා කොමඩියා

පෙට්‍රාක් - ලෝරාට සැහැලි කවි (ලකුණු 05)

**iv.** i. ලෞකිකත්වය සහ ස්වභාවිකත්වයට මුල්තැන දෙමින් නිර්මාණ බිහිවීම.

ii. ආගමික මුහුණුවරකින් බැහැර වී නිර්මාණ බිහිවීම.

iii. පුද්ගලයාගේ නමින් සිතුවම් ප්‍රසිද්ධියට පත්වීම.

උදා :- මයිකල් ඇංජිලෝ - අවසාන විනිශ්චය,

ලියනාඩෝ ඩාවින්චි - මොනාලිසා

iv. චිත්‍ර වල එළිය අඳුර ඉස්මතු කිරීම කැපී පෙනීම.

v. ෆ්ලෝරන්ස් නගරයේ මෙඩිචි පවුල චිත්‍ර කලාවට සුවිශේෂී අනුග්‍රහයක් ලබා දීම. (ලකුණු 06)

**09.**

**i.** ඉංග්‍රීසින් (බ්‍රිතාන්‍යයන්), ප්‍රංශ, පෘතුගීසි, ලන්දේසි, ස්පාඤ්ඤ (ලකුණු 03)

**ii.** i. ජනපදවාසීන්ගෙන් නව බදු පනත් මගින් බදු අයකර ගැනීම.

උදා :- සීනි පනත, මුදල් නෝට්ටු පනත, මුද්දර පනත

ii. බ්‍රිතාන්‍යයන් ජනපද වල දැඩි වාණිජවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.

iii. බ්‍රිතාන්‍ය හමුදාව ජනපදවාසීන් විසින් නඩත්තු කිරීමට සිදුවීම.

iv. නිදහස පිළිබඳ ජනපදවාසීන තුළ ආකල්පයක් ඇතිවීම හා ඊට උනන්දු වීම.

v. ජනපදවාසීන්ගේ සිතුම් පැතුම් හා ආකල්ප බ්‍රිතාන්‍ය පාලකයන් විසින් නිසි ලෙස තේරුම් නොගැනීම.

vi. ජනපදවාසීන් දිගු කාලයක් පුරා බ්‍රිතාන්‍ය මැදිහත්වීම අවමව පැවති පාලනයකට හුරුවී සිටීම.

vii. ජනපදවාසීන්ගේ සාධාරණ සටන් බ්‍රිතාන්‍ය හමුදාව දැඩිව මර්දනය කිරීම. (ලකුණු 04)

**iii.** i. සියලු බලතල රජු වටා කේන්ද්‍රගත වීම.

ii. ජනතාව දැඩි සේ පිළිකුලට පත් කළ වරෙන්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

iii. ප්‍රංශ ජනතා නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ස්ටේට්ස් ජෙනරල් සභාව නොකැඳවා රජුගේ සිතැඟි පරිදි තීරණ ගැනීම.

iv. රජුට හිතවාදී අතලොස්සක් වූ පූජක හා රදළවරුන් සමඟ කටයුතු කළ අතර සාමාන්‍ය ජනතාව නොසලකා හැරීම. (ලකුණු 05)

**iv.** i. මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව ලොව පුරා උනන්දු වීම.

ii. ප්‍රංශ රාජාණ්ඩුව බිඳ වැටීම.

iii. ප්‍රංශයේ අස්ථාවර දේශපාලන රටාවක් ඇතිවීම.

iv. වැඩවසම් සමාජ ක්‍රමය බිඳ වැටීම.

v. නැපෝලියන් වැන්නෙකු ප්‍රංශයේ පාලනයට පත්වීම.

vi. නිදහස, සමානාත්මතාව යන සංකල්ප කෙරෙහි ලොව පුරා ජනතාව උනන්දු වීම.

vii. ප්‍රංශයේ නිදහස් ගොවි පන්තියක් බිහිවීම. (ලකුණු 06)

Past Papers Wiki

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index No. } ............................




[අනෙක් පිටුව බලන්න / மறுபக்கம் பார்க்க / *See next page*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

1. (අ) (ii)




-2-

OL/2025(2026)/33/S-II

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi





Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library